# ආර්ථික විද්‍යාව

# 12 ශ්‍රේණිය

# නිපුණතාව 2.1 – 2.8

## ඉල්ලුම, සැපයුම හා නම්‍යතාව



## 2.7 :- සැපයුම් තීරක ඇසුරෙන් සැපයුම් න්‍යාය හා සැපයුම් නීතිය විග්‍රහ කරයි.

**විෂය අන්තර්ගතය :-**

- සැපයුම
  - අර්ථ දැක්වීම
  - ආයතනයක සැපයුම හා වෙළෙඳපොළ සැපයුම
  - සැපයුම තීරණය කරන සාධක
  - සැපයුම් න්‍යාය (ශ්‍රිතය)
  - සැපයුම් නීතිය
  - සැපයුම් නීතිය ඉදිරිපත් කරන ක්‍රම
    - සැපයුම් ලේඛනය
    - සැපයුම් වක්‍රය
    - සැපයුම් සමීකරණය
  - සැපයුම් නීතියට හේතු
    - වැඩි වන ආවස්ථික පිරිවැය නීතිය (ආන්තික පිරිවැය ඉහළ යෑම)

**සැපයුම**

නිශ්චිත අවස්ථාවක දී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයට පවතින විකල්ප මිල ගණන් යටතේ වෙළඳපොළේ සිටින සියලු ම සැපයුම්කරුවන් විසින් සැපයීමට බලාපොරොත්තු වන විවිධ ප්‍රමාණයන් සැපයුම ලෙස හඳුන්වයි.

| ඒකකයක මිල (රු) | අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය |
|---|---|
| 10 | 100 |
| 20 | 200 |
| 30 | 300 |
| 40 | 400 |
| 50 | 500 |

**ඵලදායී සැපයුමක් ඇති වීමට අවශ්‍ය සාධක**

- භාණ්ඩය හෝ සේවාව සැපයීමට හැකියාවක් තිබීම / අවශ්‍ය සම්පත් තාක්ෂණය ආයතනය සතුව තිබීම
- භාණ්ඩය හෝ සේවාව සැපයීම මගින් ප්‍රතිලාභයක් ලබාගත හැකි වීම
- භාණ්ඩය හෝ සේවාව සැපයීමේ සැලසුමක් තිබීම

**සැපයුමේ ප්‍රභේද**

සැපයුමේ ප්‍රභේද දෙකක් ඇත.

- පෞද්ගලික සැපයුම
- වෙළෙඳපොළ සැපයුම

**පෞද්ගලික සැපයුම (ආයතනයක සැපයුම)**

නිශ්චිත අවස්ථාවකදී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී වෙළෙඳපොළේ සිටින සැපයුම් කරුවන් අතරින් එක් සැපයුම්කරුවෙක් විසින් සලකා බලන භාණ්ඩයට පවතින විකල්ප මිල ගණන් යටතේ සැපයීමට අපේක්ෂා කරන විවිධ ප්‍රමාණයන් පෞද්ගලික සැපයුම ලෙස හඳුන්වයි.

නිදසුන් :-

| මිල | A ගේ සැපයුම් ප්‍රමාණය |
|---|---|
| 10 | 5 |
| 20 | 10 |
| 30 | 15 |

**වෙළෙඳපොළ සැපයුම**

නිශ්චිත අවස්ථාවකදී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩය සඳහා පවතින විකල්ප මිල ගණන් යටතේ වෙළෙඳපොළේ සිටින සියලු ම සැපයුම් කරුවන්ගේ පෞද්ගලික සැපයුම් ප්‍රමාණවල තිරස් එකතුව වෙළෙඳපොළ සැපයුම ලෙස හඳුන්වයි.

නිදසුන්:- පහත වගුවේ දකුණුපස කෙළෙවරේ දැක්වෙන්නේ වෙළෙඳපොළ සැපයුමවේ.

| මිල (රු) | A ගේ සැපයුම් ප්‍රමාණය | B ගේ සැපයුම් ප්‍රමාණය | C ගේ සැපයුම් ප්‍රමාණය | D ගේ සැපයුම් ප්‍රමාණය | වෙළෙඳපොළ සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 10 | 5 | 15 | 20 | 10 | 50 |
| 20 | 10 | 25 | 40 | 20 | 95 |
| 30 | 15 | 35 | 60 | 30 | 140 |

- ආයතනයක සැපයුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක පහත සඳහන් පරිදි පෙළ ගැස්විය හැකි ය.
  - සලකා බලන භාණ්ඩයේ මිල (P)
  - යෙදවුම් මිල (C)
  - තාක්ෂණය (T)
  - සම්බන්ධිත භාණ්ඩවල මිල ගණන් (Pn)
  - නිෂ්පාදකයන්ගේ අපේක්ෂා (Ex)
  - රජයේ ප්‍රතිපත්ති (G)
  - වෙනත් සාධක (O)

- වෙළෙඳපොළ සැපයුම තීරණය කරන සාධක පහත සඳහන් පරිදි පෙළ ගැස්විය හැකි ය.
    - සලකා බලන භාණ්ඩයේ මිල (P)
    - යෙදවුම් මිල (C)
    - තාක්ෂණය (T)
    - සම්බන්ධිත භාණ්ඩ වල මිල ගණන් (Pn)
    - නිෂ්පාදකයන්ගේ අපේක්ෂා (Ex)
    - වෙළෙඳපොළේ සිටින නිෂ්පාදකයින්ගේ සංඛ්‍යාව (N)
    - රජයේ ප්‍රතිපත්ති (G)
    - වෙනත් සාධක (O)

- ආයතනික සැපයුම තීරණය කරන සාධක වලට අමතර ව වෙළෙඳපොළේ සිටින නිෂ්පාදකයන්ගේ සංඛ්‍යාව වෙළෙඳපොළ සැපයුම තීරණය කරන සාධකවලට එකතු වේ.

**සැපයුම් ශ්‍රිතය**

- කිසියම් භාණ්ඩයක් සඳහා ආයතනික සැපයුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය දක්වන සමීකරණය ආයතනික සැපයුම් ශ්‍රිතය වේ. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

$$Q_S = f(P, C, T, Pn, Ex, G, O)$$

- කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ සැපයුම හා එය තීරණය කරන සාධක අතර සම්බන්ධය දක්වන සමීකරණය වෙළෙඳපොළ සැපයුම් ශ්‍රිතය වේ. එය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

$$Q_S = f(P, C, T, Pn, Ex, N, G, O)$$

**සැපයුම් න්‍යාය**

සැපයම තීරණය විමට බලපාන ඕනෑම ස්වායත්ත විචල්‍යයක් වෙනස්වීමට ප්‍රතිචාරී ව සලකා බලන භාණ්ඩයේ සැපයුම වෙනස්වන ආකාරය විග්‍රහ කොට දැක්වීම සැපයුම් න්‍යාය ලෙස හැඳින්වේ.

$$Qs = f(P, Pn, C, T, G, Ex, O,N)$$

**සැපයුම් නීතිය**

නිශ්චිත අවස්ථාවක දී සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධය සැපයුම් නීතියයි. සැපයුම් නීතිය මගින් ප්‍රකාශ කරන්නේ මිල වැඩි වනවිට සැපයුම් ප්‍රමාණය වැඩි වන බව හා මිල අඩු වන විට සැපයුම් ප්‍රමාණය අඩු වන බවත්ය.

**සැපයුම් නීතියට පදනම් වන උපකල්පන**

මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවයක් ඇතිවන්නේ පහත කොන්දේසි ඉටුවන විටය.

**(1) නිශ්චිත අවස්ථාවක මිල හා සැපයුම් ප්‍රමාණය සැලකිල්ලට ගත යුතුය.**

| නිදසුන්:- | වර්ෂය | පරිගණක මිල | පරිගණක සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|
| | 2000 | 100 000 | 1000 |
| | 2017 | 50 000 | 5000 |

ඉහත දැක්වෙන්නේ නිශ්චිත අවස්ථාවක මිල හා සැපයුම් ප්‍රමාණය නොවේ එම තොරතුරු මගින් සැපයුම් නීතිය විග්‍රහ කළ නොහැක. මක් නිසාද වසර 17කට පසු සැපයුම කෙරෙහි බලපාන අනෙකුත්

සාධක වෙනස්වේ. කවර සාධකය බලපෑම මත සැපයුම වෙනස් වූයේද යන්න නිශ්චිත ව කිව නොහැක.

### (2) සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව පැවතීම

සලකා බලන භාණ්ඩයේ මිල පමණක් වෙනස්විය යුතුය. මිල හැර අනෙකුත් සාධක නොවෙනස්ව පවතින බව උපකල්පනය කළ යුතුය. එවිට සැපයුම් ප්‍රමාණය වෙනස් වූයේ මිල වෙනස නිසා ම බව සනාථ කළ හැකිය.

### සැපයුම් නීතිය ඉදිරිපත් කරන ක්‍රම

සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවය ඉදිරිපත් කළ හැකි ක්‍රම තුනක් ඇත.

1. සැපයුම් ලේඛනය
2. සැපයුම් වක්‍රය
3. සැපයුම් සමීකරණය


### සැපයුම් ලේඛනය

නිශ්චිත අවස්ථාවක සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයට පවතින විකල්ප මිල ගණන් යටතේ වෙළෙඳපොළේ සිටින සැපයුම්කරුවන් විකිණීමට ඉදිරිපත් කරන ඒකක ප්‍රමාණයන් දක්වන ලේඛනය සැපයුම ලේඛනය ලෙස හඳුන්වයි.

| මිල | අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය |
|---|---|
| 10 | 100 |
| 20 | 200 |
| 30 | 300 |
| 40 | 400 |
| 50 | 500 |

### සැපයුම් වක්‍රය

නිශ්චිත අවස්ථාවක දී සැපයුම් කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස් ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණ සම්බන්ධ කොට අඳින ලද රේඛාව සැපයුම් වක්‍රය නම් වේ.




සාමාන්‍ය භාණ්ඩයක සැපයුම් වක්‍රය වමේ සිට දකුණට පහළ සිට ඉහළට බෑවුම් වේ. සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන්නේ වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය නිසාය

## සැපයුම් සමීකරණය

නිශ්චිත අවස්ථාවක සැපයුම තීරණය වීම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධය සමීකරණයන් මගින් සාරාංශ කොට දැක්වීම සැපයුම් සමීකරණය ලෙස හඳුන්වයි.

ඉහළට බෑවුම් වන ඕනෑම සැපයුම් වක්‍රයක සමීකරණය පහත දැක්වේ.

$$Qs = a + bp$$

Qs = සැපයුම් ප්‍රමාණය

a = මිල 0 දී සැපයුම් ප්‍රමාණය

b = සැපයුම් වක්‍රයේ බෑවුමේ පරස්පරය $b = \frac{\Delta Qs}{\Delta P}$

P = සලකා බලන භාණ්ඩයේ මිල

ඉහත රූපසටහනට අදාළ සැපයුම් වක්‍රයෙ සමීකරණය පහත පරිදි වේ.

$$Qs = 10P$$

ඉහත සැපයුම් සමීකරණය මඟින් මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවය පෙන්විය හැක.


| මිල රු. 20 දී සැපයුම් ප්‍රමාණය | මිල රු. 40 දී සැපයුම් ප්‍රමාණය | මිල රු. 30 දී සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| Qs = 10P<br>= 10 × 20<br>= 200 | Qs = 10P<br>= 10 × 40<br>= 400 | Qs = 10P<br>= 10 × 30<br>= 300 |


## සැපයුම් නීතියට හේතු

### සලකා බලන භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධයක් ඇතිවීමට හේතුව

මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධයක් ඇතිවීමට ප්‍රබලම හේතුව වැඩි වන ආවස්ථික පිරිවැය නීතිය වේ. එනම් යම් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කරන විට අතිරේක ඒකකයක් නිපදවීමට වැයවන ආන්තික පිරිවැය ක්‍රමයෙන් වැඩි වේ. එම නිසා සැපයුම් ප්‍රමාණය වැඩි කිරීමට හැකිවන්නේ වැඩි වන මිල ගණන් යටතේ ය.

පහත රූප සටහන මගින් පෙන්වන්නේ සැපයුම් ප්‍රමාණය වැඩි කරන විට ආන්තික ආවස්ථික පිරිවැය වැඩිවන ආකාරය වේ. මේ අනුව සැපයුම වැඩි කිරීමට වැඩි වන මිල ගණන් අයකිරීමට සිදු වේ.


y භාණ්ඩ
15
14
12
9
5
0
1
2
3
4
5
X භාණ්ඩ


X භාණ්ඩයේ මිල
S
5
4
3
2
1
0
1
2
3
4
5
X භාණ්ඩ ප්‍රමාණය